# ගොවිතැන් ක්‍රම

ලංකාවේ කෘෂිකර්මාන්තය තුළ මේ වන විට හඳුනා ගත හැකි ගොවිතැන් ක්‍රම ගණනාවකි මෙම ගොවිතැන් ක්‍රම ගොවිතැන් පද්ධති ලෙස ද හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ගොවීන් අනුගමනය කරනු ලබන ගොවිතැන් පද්ධති කිහිපයකි.

1. හේන් ගොවිතැන
2. සමෝධානිත ගොවිතැන
3. සංරක්ෂණ ගොවිතැන
4. කෘෂි වන වගාව

# හේන් ගොවිතැන

- ශ්‍රී ලංකාවේ මුල්ම ගොවිතැන් ක්‍රමයයි. අවම යෙදවුම් භාවිතයෙන් වර්ෂාව පදනම් කරගෙන පවුලේ ශ්‍රමය යොදාගනිමින් හේන් ගොවිතැන් සිදු කරයි.
- යම් භූමියක කන්න කීපයක් වගාකර එම භූමිය නිසරු වූ විට එය අත්හැර දමා වෙනත් භූමියක් සකස්කර වගාකරයි. ඉඩම් මාරු කිරීම හේන් ගොවිතැනේ විශේෂ ලක්ෂණයයි.

# හේන සකස් කරන ආකාරය

- හෙක්ටයාර එකක හෝ දෙකක ප්‍රමාණයේ භූමියක් තෝරාගෙන කැළෑව කපා එලි පෙහෙළි කරයි. පසුව එය ගිනි තැබීම සිදුකරයි.



- ටික දිනකට පසුව නොපිලිස්සුනු දැව කොටස් යොදාගෙන භූමිය වටේ දඬුවැට සකස් කරයි.

- බිම් සකස් කිරීමක් හෝ පාත්ති සෑදීමක් නොකරයි.




- වැසි ආරම්භයත් සමඟ බීජ සිටුවීම හෝ වැපිරීම සිදුකරයි. බෝගවර්ග කිහිපයක් එකවිට වගා කරයි.



W.K.R.Anandasiri. R/Viddyaloka m.m.v .
Balangoda.

# හේන් ගොවිතැනෙහි පියවර හා කාලසීමාවන්

- කැළෑව කපා එළිපෙහෙළි කිරීම.
- කැළෑව ගිනි තැබීම.
- දඹු වැට සකස් කිරීම.
- බීජ සිටුවීම හෝ වැපිරීම.
- පැල් රැකීම.
- අස්වනු නෙලා ගැනීම.

- ජුලි සිට අගෝස්තු දක්වා.
- අගෝස්තු සිට මැද සැප්තැම්බර්
- සැප්තැම්බර් මැද සිට
- සැප්තැම්බර් අග සිට නොවැම්බර් මැද දක්වා
- අස්වනු නෙලා අවසන්වන තුරු
- දෙසැම්බර් සිට මාර්තු දක්වා

# හේන් ගොවිතැනෙහි විශේෂ ලක්ෂණ

- වර්ෂා ජලය පමණක් භාවිත කරයි.
- කෘෂි රසායනික භාවිත නොකරයි.
- එකවර බෝග වර්ග රාශියක් වගා කරයි.
- බිම් සකස් කිරීමක් හෝ පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීමක් නැත.
- භූමිය මාරුකිරීමට ලක් කරයි.



# හේන් ගොවිතැනෙහි වාසි

- ප්‍රාග්ධනය එතරම් අවශ්‍ය නොවේ.
- ජලසම්පාදනයක් අවශ්‍ය නොවේ.
- උපකරණ භාවිතය අඩුය.
- කෘමිනාශක අවශ්‍ය නොවේ.
- පොහොර යෙදීමක් නැත.

# හේන් ගොවිතැනෙහි අවාසි

- වන විනාශය.
- සතුන්ගේ වාසස්ථාන අහිමිවීම.
- පාංශු ඛාදනය වීම.
- හිතකර පාංශු ජීවීන් විනාශ වීම.
- නියමිත කාලයට වර්ෂාව නොලැබුණහොත් වගාව විනාශ වේ.
- වන සතුන්ගෙන් හානි සිදු වේ.



# සමෝධානිත ගොවිතැන

- එක් නිෂ්පාදන ඒකකයක අතුරුඵල වෙනත් නිෂ්පාදනය ඒකකයක අමුද්‍රව්‍ය ලෙස යොදාගනිමින් එකම භූමියක් තුළ බෝග වගාව සත්ත්ව පාලනය බලශක්ති නිපදවීම සහ පොහොර නිෂ්පාදනය ඒකාබද්ධව සිදු කිරීම සමෝධානිත ගොවිතැනයි.




W.K.R.Anandasiri. R/Viddyaloka m.m.v . Balangoda.

# සංරක්ෂණ ගොවිතැන

කිසියම් භූමියක පස ජලය පෝෂක හා ජෛව විවිධත්වය ආරක්‍ෂාවන පරිදි අවම යෙදවුම් භාවිත කරමින් පරිසරය සුරක්‍ෂිත වන අයුරින් පවත්වාගෙන යන ගොවිතැන් ක්‍රමය සංරක්‍ෂණ ගොවිතැනයි.

# සංරක්ෂණ ගොවිතැන් ක්‍රමයේ අරමුණු

- පසේ සාරවත් භාවය රැකගැනීම.
- පාංශු ඛාදනය වැලැක්වීම.
- වගාවට අවශ්‍ය පොහොර ගොවිපළෙන්ම ලබා ගැනීම.
- බෝග විවිධාංගීකරණය කිරීම.
- පෝෂණීය ආහාර වේලක් ලබා ගැනීම.
- අවශ්‍ය දැව ලබාගැනීම.

# සංරක්‍ෂණ ගොවිතැන් පද්ධති කිහිපයක් ඇත

- ශූන්‍ය බිම් සැකසුම් පද්ධති
- මිශ්‍ර බෝග පද්ධති
- කෘෂි වන වගා පද්ධති
- බෝග ඉපනැලි සහ සජීව ආවරණ බෝග වසුන් පද්ධති
- ජෛව අස්ථරණ පද්ධති

# සංරක්ෂණ ගොවිතැන් ක්‍රමයේ

- වාසි

- පාංශු ඛාදනය අවම වේ.
- ජෛව විවිධත්වය ආරක්‍ෂාවේ.
- පසේ උෂ්ණත්වය පාලනය වේ.
- පසේ සාරවත්භාවය වැඩි වේ.

- අවාසි

- මුදල් වැය වේ.
- උප පද්ධති අතර නොගැලපීම් සිදුවිය හැක.

# වගා රටා

- කිසියම් භූමියකින් නිශ්චිත කාලසීමාවකදී උපරිම ඵලදාවක් ලැබෙන අයුරින් බෝග වගා කර ඇති ආකාරය වගා රටා ලෙස හැඳින්වේ.

# වගාරටා



# ඒක බෝග වගාව

- කිසියම් භූමියක එක් බෝගයක් පමණක් අඛණ්ඩව වගා කිරීම ඒක බෝග වගාවයි.

උදා :- තේ වගාව
රබර් වගාව
පොල් වගාව
වී වගාව









| ඒක බෝග වගාවේ වාසි | ඒක බෝග වගාවේ අවාසි |
| --- | --- |
| • නඩත්තු කිරීම පහසුය.<br>• පොහොර හා කෘෂි රසායන වර්ග වැඩි ගණනක් අවශ්‍ය නොවීම<br>• විවිධ පර්යේෂණ වලට යොමු විය හැකි වීම.<br>• එක බෝගයක් වගාකිරීම පිළිබඳ දැනුම ප්‍රමාණවත් වීම. | • පළිබෝධ ව්‍යාප්තවීම වැඩිය.<br>• එක පාංශු ස්ථරයක පෝෂක පමණක් ප්‍රයෝජනයට ගැනීම.<br>• සැපයුම වැඩිවීම නිසා මිල අඩුවිය හැකිවීම. |

# බහු බෝග වගාව

එකම භූමියක එකම කාලසීමාවකදී බෝග වර්ග එකකට වඩා වැඩි සංඛ්‍යාවක් වගා කිරීම බහු බෝග වගාවයි.

බෝග අතර ජලය , පෝෂක , හිරු එළිය හා ඉඩකඩ සඳහා තරගයක් ඇති නොවන පරිදි බෝග තොරා ගතයුතුයි.

හිතකර අන්තර් සබඳතා ඇති බෝග තෝරාගත යුතුයි.

# ශෂ්‍ය මාරුව ( බෝග මාරුව )

තෝරා ගන්නා ලද බෝග කිහිපයක් ක්‍රමානුකූලව කන්නයෙන් කන්නයට මාරු කිරීමට ලක් කරමින් එකම භූමියේ වගා කිරීම ශෂ්‍ය බෝග මාරුවයි.

මේ සඳහා බෝග දෙකක් තුනක් හෝ හතරක් යොදාගත හැකිය. බහුලව භාවිත වන්නේ සිව් බෝග මාරුවයි.

සිව් බෝග මාරුවේදී භූමිය හතරකට බෙදා එම කොටස්වල ධාන්‍ය බෝගයක් රනිල බෝගයක් හා එළවලු බෝගයක් බැගින් සිටුවයි. ඊළඟ කන්නයේදී එම බෝග මාරු කරමින් කොටස්වල වගා කරයි.






## I කන්නය




## ii කන්නය




## iii කන්නය




## iv කන්නය




W.K.R.Anandasiri. R/Viddyaloka m.m.v . Balangoda.

# ශෂ්‍යමාරු ගොවිතැනේ වාසි

- පසේ විවිධ ස්ථරවල ඇති පෝෂක ලබා ගත හැකිය. පළිබෝධ පාලනය වේ.
- ගොවියාගේ අඩමානය හා අවදානම අඩුවේ.
- පස සාරවත් වේ.
- වසර පුරා ආදායම් ලැබේ.
- භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකිවේ.

# ශෂ්‍යමාරු ගොවිතැනේ අවාසි

- ගොවියාගේ විවේකය අඩුවේ.
- ආදායම් එකවර නොලැබේ.
- දැනුමක් අවශ්‍ය වේ.
- ශ්‍රමය වැඩිපුර අවශ්‍ය වේ.

# මිශ්‍ර බෝග වගාව

- යම් භූමියක බෝග වර්ග දෙකක් හෝ වැඩි ගණනක් වගාකිරීම මිශ්‍ර බෝග වගාවයි.




# මිශ්‍ර බෝග වගාවේ

| වාසි | අවාසි |
| --- | --- |
| • ඒකීය ක්ෂේත්‍රයකින් වැඩි අස්වැන්නක් ලැබේ.<br>• පංගු බාදනය අඩුවේ.<br>• පළිබෝධ හානිය අවම වීම.<br>• පස සරුවීම. | • අස්වනු නෙලීම විවිධ කාල වලදී කලයුතු වීම.<br>• නඩත්තු කටයුතු අපහසු වීම. |

# අතුරු බෝග වගාව

- වගාකර ඇති ප්‍රධාන බෝගය අතර එම බෝගයට තරගයක් ඇති නොවන ලෙස වෙනත් බෝග එකක් හෝ කිහිපයක් ක්‍රමවත්ව වගා කිරීම. අතුරු බෝග වගාවයි.




# අතුරු බෝග වගාවේ

| වාසි | අවාසි |
|---|---|
| • වල් පැළෑටි පාලනය වේ.<br>• ප්‍රධාන බෝගයට අමතරව අතුරු බෝගයේද අස්වැන්න ලැබේ.<br>• හිරු එළිය, පොහොර, ජලය ආදී සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලැබේ. | • අස්වනු නෙළීමේදී ගැටළු ඇති වේ.<br>• තරමක දැනුමක් අවශ්‍ය වේ.<br>• විවේකය අඩුවේ. |

# කඩින් කඩ වගාව

- එක් බෝගයක ජීවන චක්‍රය අවසන් වීමට පෙර තවත් බෝග වර්ග දෙකක් හෝ කිහිපයක් පළමු බෝග අතර සිටුවා එකම භූමියක වගා කිරීම කඩින් කඩ වගාවයි.
- පළමු බෝගය ප්‍රජනක අවස්ථාව පත්වන විට දෙවන බෝගය සිටුවනු ලැබේ පළමු බෝගයේ අස්වනු නෙලන තෙක් දෙවන බෝගය වර්ධනය වේ දෙවන බෝගයේ ප්‍රජනක අවස්ථාවට පත්වන විට තවත් බෝගයක් පළමු බෝගය වෙනුවට සිටුවිය හැක.
- මෙහි ප්‍රධාන වාසිය වන්නේ අඩු කාලයකදී වැඩි බෝග ගණනක් වගා කළ හැකි වීමයි.

# අභ්‍යාස

1) හේන් ගොවිතැනේ වාසි අවාසි දෙක බැගින් දක්වන්න

2) සමෝධානිත ගොවිතැනේ වාසි තුනක් දක්වන්න

3) අතුරු බෝග වගාව හඳුන්වන්න

4) කඩින් කඩ වගාවෙන් ලැබෙන ප්‍රධාන වාසිය කුමක්ද?